(04)

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2017/2018

LLU3904/LWU1412- නීති ක්‍රම

කාලය - පැය(03) තුනයි.

---

දිනය - 2020.03.03 වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30

---

01 වන හා 02 වන කොටස්වලින් අඩු වශයෙන් ප්‍රශ්න දෙක බැගින් ප්‍රශ්න <u>පහකට (05)</u> පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

<u>පළමු කොටස - රෝම නීතිය.</u>

01. "රෝම නීතිය - නීති පද්ධතියක පදනම" යන මැයෙන් ඉතාලියේ පැවැත්වීමට නියමිත නීති සමුළුවක ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා ඔබ ආරාධනා ලැබ සිටින්නේ යැයි උපකල්පනය කරන්න. රෝම නීතියේ ඉතිහාසය පාදක කර ගනිමින් දේශනයක් පැවැත්වීම ඔබ විසින් කළ යුතුව ඇත. රෝම ඉතිහාසයේ කාල පරිච්ඡේද සහ රෝම නීතියේ මූලාශ්‍ර ඇසුරෙන් ඔබේ දේශනයේ සැලසුම සකස් කරන්න. (ලකුණු 20)

02. අ) "සෑම රෝමානු පුරවැසියෙකුටම අන්තිම කැමති පත්‍රයක් සකස් කිරීමට, අන්තිම කැමති පත්‍රයක් යටතේ දේපල ලබා ගැනීමට සහ අන්තිම කැමති පත්‍රයක සාක්ෂිකරුවකු වීමට අවසර දී තිබුණි."

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද?

අදාළ නෛතික මූලධර්ම සහ උදාහරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 12)

ආ) රෝම නීතියේ විවිධ කාල පරිච්ඡේද වලදී භාවිතයට ගත් විවිධාකාර වූ අන්තිම කැමති පත්‍ර ආකෘති පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(මුළු ලකුණු 20)

03. රෝම නීතිය ඇසුරෙන් පහත ප්‍රකාශනවල නිරවද්‍යතාව සලකා බලන්න.

i) රෝමයේ ව්‍යවස්ථාදායක බලය, ඉතිහාසයේ විවිධ කාලපරිච්ඡේද වලදී වෙනස්කම්වලට ලක් විය.

ii) *Dos* යනු විවාහය මිස *Concubinage* යන්න අරමුණු නොකළ බවට සාක්ෂියකි.

iii) නීතිය සංග්‍රහිත කිරීමේ දී ජස්ටීනියන් අධිරාජයා අනගි මෙහෙයක් ඉටු කළේය.

iv) පවුලක ජීවතුන් අතර සිටින වැඩිමහල්ම ආදි පුරුෂයා ඔහුගේ පවුල කෙරෙහි අසීමිත බලයක් ක්‍රියාත්මක කලේය.

(ලකුණු 4 x 5 = 20)

04. i) අ) *Confarreatio* චාරිත්‍රය සම්පූර්ණ කරමින් කැමීලියා ඔස්ටින් සමග විවාහ විය. ඔවුන්ට ඕනුස් නම් පුතෙකු සිටි අතර ඇවිදීමට පටන්ගත් අවධියේ හටගත් දරුණු රෝගයක් හේතුවෙන් ඔහු ආබාධිත තත්වයට පත්විය. තම පුතුගේ මෙම තත්ත්වය පිළිබඳ ව ඇති වූ මානසික බලපෑම හේතුවෙන් ඔස්ටින් සිය දිවි නසා ගත්තේ ය. ආබාධිත දරුවා සමග තනිව ජීවත් වන කැමීලියාට දරුවකු දරුකමට ගැනීමට අවශ්‍ය වී තිබේ.

ආ) තම patrician පවුලෙන් ඉවත් කරන ලද සිල්වියා නැමැති ධනවත් නිළිය සමග විවාහ වීමට සෙනෙට් සභිකයකු වන පැබ්ලෝ අදහස් කරයි. නීත්‍යානුකූල විවාහයක් සඳහා වන අවශ්‍යතා මොනවාදැයි දැන ගැනීමට පැබ්ලෝ අපේක්ෂා කරයි. *Dos* දායාදය ලබා දිය යුත්තේ කා විසින් ද යන්න සහ *Dos* සම්බන්ධයෙන් පූර්වයෙන් දැනුවත් විය යුතු කරුණු පිළිබඳව දැන ගැනීමට සිල්වියාට අවශ්‍ය වී තිබේ.

කැමීලියා, පැබ්ලෝ සහ සිල්වියා හට උපදෙස් දෙන්න.

(ලකුණු 5 x 2 = 10)

ii) "රෝම නීතිය භුක්තිය නම් සංකල්පයෙන් වෙනස් වෙමින් හිමිකම පිළිබඳ සංකල්පය ඉදිරිපත් කරයි."

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? අදාළ නෛතික සංකල්ප සහ ප්‍රායෝගික උදාහරණ ඇසුරෙන් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

## දෙවන කොටස - නීති ක්‍රම

05. "ව්‍යවස්ථාවක සැබෑ අර්ථය බල ගැන්වෙන පරිදි කාර්යාර්ථමය ප්‍රවේශයක් යොදා ගනිමින් ව්‍යවස්ථා පැනවීමේ පසුබිම හා සම්බන්ධ වූ වඩාත් පරිබාහිර කරුණු විමසා බැලීමට වර්තමාන අධිකරණය කටයුතු කරයි."

*Pepper v Hart (1993) 1All ER at p.50*

ව්‍යවස්ථා අර්ථ නිරූපණයට අදාළ රීතීන් ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර යෝග්‍ය නඩු තීන්දු නීතිය ඇසුරෙන් සනාථ කරන්න. (ලකුණු 20)

06. "සියලුම නීති දරදඬු බවට පත්වන ස්වභාවයට පැමිණි විට සාධාරණත්වය පැන නගී... දැඩි නීතියේ දරදඬු බව අඩු කිරීමට සාධාරණත්වය නියමාකාරයෙන් උද්ගත වේ."

Lord Denning, *The Family Story (1981).p.176*

සාධාරණත්වය, නීතියේ මූලාශ්‍රයක් ලෙස පිළිගැනීමේ යුක්ති සහගතභාවය ඉහත ප්‍රකාශයට අදාළව විවේචනාත්මකව විග්‍රහ කරන්න. (ලකුණු 20)

07. (i) නිලුපුල් මෑතක දී ශ්‍රී ලංකාවට පැමිණ 'වෙදගම' නම් ග්‍රාමයේ පදිංචි වී සිටී. ඔහු වනාන්තර තුළින් ඖෂධීය ශාක එකතු කිරීම පිළිබඳව ඕස්ට්‍රේලියාවේ විද්‍යාත්මක පුහුණුවක් ලබා සිටී. ඔහු සතු දැනුම භාවිත කරමින් 'වෙදගම' වනාන්තරයේ ඖෂධීය ශාක එකතු කිරීමෙහි නිරතවීමට නිලුපුල් උත්සාහ දරයි. එම ගමෙහි සිටින 'පාලෝස්' නම් විශේෂ ජන සමූහයකට පමණක් මෙම වනාන්තරයේ ඖෂධීය ශාක එකතු කිරීමේ අයිතිය හිමි බවත් මෙම පුරුද්ද අනාදිමත් කාලයක සිට නොකඩවා පවත්වාගෙන එන බවත් දක්වමින් ගම්වාසීහු නිලුපුල් විසින් ඖෂධීය ශාක එකතු කිරීම වැළැක්වූ හ. ගම්වාසීන් තවදුරටත් පෙන්වා දෙන්නේ නිලුපුල් එම විශේෂ ජන සමූහයට අයත් නොවන බවයි.

කෙසේ වුවද, ජන සමූහ විසින් සිදු කරන එවැනි ක්‍රියා ශ්‍රී ලංකා වනසත්ව සහ වෘක්ෂලතා ආරක්ෂණ පනත යටතේ තහනම් කර තිබේ.

දේශීය චාරිත්‍රයක් බලාත්මක කිරීම සඳහා අධිකරණය විසින් යොදාගත් පරීක්ෂණය ඇසුරෙන් නිලුපුල්ට උපදෙස් දෙන්න. (ලකුණු 10)

(ii) "මෙම සිත්ගන්නා සුළු ප්‍රශ්නයට පිළිතුර වන්නේ, සම්පූර්ණ අනුගම්‍ය පූර්ව නිදර්ශන න්‍යාය පදනම් වන සිද්ධාන්තය වන්නේ, සාමාන්‍ය රීතියක් ලෙස විනිශ්චයකාරවරුන් කරුණු හෝ නීතියට අදාළව දෝෂ සිදු නොකරන බවයි."

*Arthur L. Goodhart, Determining the Ratio Decidendi of a Case, The Yale Law Journal, Vol.40, No. 2(Dec.,1930),pp.161-183.*

ඉහත ප්‍රකාශය අනුගමන පූර්ව නිදර්ශන න්‍යාය ඇසුරෙන් විවේචනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

08. දුම්කොළ භාවිතය පාලනය කිරීම පිළිබඳව වන ලෝක සෞඛ්‍ය සංවිධාන සම්මුතියේ පාර්ශ්වයක් වීමෙන් අනතුරුව සීලන්ඩ් රාජ්‍යය, 2017 අංක 09 දරණ දුම්කොළ සඳහා වන ජාතික අධිකාරී පනත සම්පාදනය කරන ලදී.

එහි පූර්විකාව දක්වන්නේ,

"දුම්පානය කිරීමෙන් ඇතිවිය හැකි හානිවලින් මහජනතාව ආරක්ෂා කිරීම අත්‍යාවශ්‍ය වී තිබේ. ..."

පනතේ 9 වන වගන්තිය දක්වන්නේ,

"කිසිම පුද්ගලයකු සංවෘත පොදු ස්ථානයකදී කිසිදු දුම්කොළ නිෂ්පාදනයක දුම්පානය නොකළ යුතුය."

උතුරු සීලන්ඩ් විශ්වවිද්‍යාලය සීලන්ඩ් රාජ්‍යයේ අගනගරයේ පිහිටා ඇති ජාතික විශ්වවිද්‍යාලයකි. මෙහි ඉංජිනේරු පීඨයට අයත් ආපන ශාලාව තුන් පැත්තකින් බිත්ති සහිත වන අතර බිත්තියක් නොමැති අනෙක් පස ක්‍රීඩා පිට්ටනියට මුහුණලා තිබෙන බැවින් 'විවෘත ආපන ශාලාව' ලෙස හඳුන්වයි. ආපන ශාලාව වහලකින් ආවරණය වී තිබෙන අතර පොළවට සිමෙන්ති දමා ඇත.

විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකු වන මල්ශාන්, සිසුන් බොහෝ සංඛ්‍යාවක් සිටින දිවා ආහාර කාලයේ දී ආපන ශාලාව තුළ දී සිගරැට්ටුවක් පානය කරන ලදී. පනතේ 9 වන වගන්තිය යටතේ වරදක් සිදු කිරීමට අදාළව ඔහුට අධිචෝදනා පමුණුවන ලදී. මල්ශාන් තර්ක කර සිටින්නේ, විවෘත ආපන ශාලාව ලෙස හඳුන්වන මෙය එක් පසකින් බිත්තියකින් ආවරණය වී නොමැති බැවින් සංවෘත පොදු ස්ථානයක් යන ගණයට නොවැටෙන බවයි.

ඔබ නීතිඥවරයකු යැයි උපකල්පනය කරමින් ව්‍යවස්ථා අර්ථ නිරූපණයට අදාළ රීතීන් හඳුනාගනිමින් මල්ශාන් ට උපදෙස් දෙන්න.

අදාළ නඩු තීන්දු නීතිය ඇසුරෙන් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.